# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## මානව හිමිකම් හා සාම අධ්‍යයනය පිළිබඳ දුරස්ථ

## අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2007/2008

## දෙවන ප්‍රශ්න පත්‍රය - සාම අධ්‍යයනය

## (පැය දෙකයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06

ප්‍රශ්න __තුනකට පමණක්__ පිළිතුරු සපයන්න

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ)

1. "සාමය යනු යුද්ධයක් හෝ ගැටුමක් නොමැති අවස්ථාවකි"

   ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද? උදාහරණ මගින් ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

2. "ගැටුම" යන සංකල්පය සහ "විවිධත්වය" යන්න සමඟ එහි ඇති සබඳතාවය අර්ථ කථනය කරන්න.

3. ගැටුම් සඳහා හේතු වන ප්‍රධාන කරුණු පහක් හඳුනාගෙන ඉන් දෙකක් සාකච්ඡා කරන්න.

4. ශ්‍රී ලංකාව තුළ පවතින ගැටුමේ ජනවාර්ගික පැතිකඩ හඳුනාගෙන ඔබේ මතය අනුව එම ගැටුම උදෙසා සාමකාමී විසඳුමක් සෙවීමේ දී විශිෂ්ටතම විසඳුම විය හැකි, යටත්පිරිසෙයින් ගත හැකි උත්සාහයක් සාකච්ඡා කරන්න.

5. ගෝලීයකරණයට ලක් වූ ලෝකය තුල ගැටුම් නිරාකරණය සඳහා එක්සත් ජාතීන්ගේ භූමිකාව සාකච්ඡා කරන්න.

6. ඕනෑම සාර්ථක ගැටුම් නිරාකරණ ක්‍රමෝපායක දී තෙවන පාර්ශවීය සමථකරණය අවශ්‍යයැයි ඔබ සලකන්නේද? හේතු දක්වන්න.

5. මානව හිමිකම් ආරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා ඇති අන්තර්ජාතික යාන්ත්‍රණ සම්බන්ධයෙන් හා එහි ප්‍රමාණවත් භාවය හෝ නැතහොත් ඉහත අරමුණ සපුරා ගැනීම සඳහා ඵලදායී මෙවලමක් ලෙස එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව අදහස් දක්වන්න.

6. පහත දැක්වෙන තුනක් පිළිබඳ සටහන් ලියන්න.

   1. කණ්ඩායම් අයිතිවාසිකම්
   2. සුබ සාධන රාජ්‍යය පිළිබඳ අදහස
   3. මැග්නා කාර්ටා
   4. සංස්කෘතික සාපේක්ෂතාවය

# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## මානව හිමිකම් හා සාම අධ්‍යයනය පිළිබඳ දුරස්ථ

## අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2007/2008

## පළමු ප්‍රශ්න පත්‍රය - මානව හිමිකම්

## (පැය දෙකයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06

ප්‍රශ්න <u>තුනකට පමණක්</u> පිළිතුරු සපයන්න

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ)

1. මානව හිමිකම් යනුවෙන් ඔබ කුමක් අදහස් කරන්නේදැයි විස්තර කරන්න.

   ඉහත ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඔබ උපුටා දැක්වීමට කැමති දේශපාලන - නීති න්‍යාය විස්තර කරන්න.

2. සියලු ආකාරයේ රජයන් අතුරින් ප්‍රජාතන්ත්‍රවාදය වඩා විශිෂ්ඨ යැයි ඔබ සිතන්නේද?

   ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් අංග ලක්ෂණ ඉස්මතු වන ලෙස ඔබේ පිළිතුර විස්තරාත්මකව දක්වන්න.

3. මානව හිමිකම් පනත - යන්නෙන් ඔබට කුමක් අදහස් වේද?

   බොහෝ රටවල දේශපාලන ඉතිහාසය වෙනස් කල මෙවැනි ලේඛණ අවම වශයෙන් තුනක් දක්වමින් ඒවායේ මූලික ලක්ෂණ විස්තර කරන්න.

4. ලංකානා දශකයකට පමණ පෙර තම යටත් විජිත පාලකයන්ගෙන් නිදහස ලැබූ දියුණු වෙමින් පවතින, දරුණු සිවිල් යුධ තත්වයකට මුහුණ පා සිටින රටකි. ලංකානා සිවිල් යුධ සමයේ දී ජාත්‍යන්තර ප්‍රජාවට පිළිගත හැකි ආකාරයට සිය පුරවැසියන්ට සැලකීමට අපොහොසත් වී ඇතැයි ජාත්‍යන්තර සංවිධානයක් විසින් චෝදනා කර ඇත. ඔබ විදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයාගේ නීති උපදේශක ලෙස පත් කර ඇතැයි සිතන්න. සිය ~~පුරවැසියන්ට සැලකීම ස්වාධිපත්‍යය රාජ්‍යයක අභ්‍යන්තර කටයුත්තක් බවත් ජාත්‍යන්තර~~ ප්‍රජාවට ඒ සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට හේතුවක් නොමැති බවත් දක්වමින් වාර්තාවක් ඔබ ලවා පිළියෙල කරවීමට ඔහුට අවශ්‍ය වී ඇත.

   ජාත්‍යන්තර නෛතික ලේඛණ ඇසුරින් අධිකාරීන් දක්වමින් වාර්තාව පිළියල කරන්න.